| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 9 ශ්‍රේණිය | **නාට්‍ය හා රංගකලාව** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2

- සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. නාට්‍ය පෙළක අන්තර්ගත නොවන්නකි.
   i. සංවාද iii. කැමරාකරණය
   ii. රංගවිධාන iv. ගැටුම

2. නාට්‍ය පෙළක අනිවාර්යයෙන් අන්තර්ගත විය යුත්තේ,
   i. සට්ටනය iii. අංගරචනය
   ii. සංගීතය iv. ප්‍රේක්ෂක ප්‍රතිචාර

3. කදාවළලු නාට්‍යය සඳහා පාදක නාට්‍ය වස්තුව උපුටාගත් ජාතක කතාව වනුයේ,
   i. කාලගෝල ප්‍රශ්නයෙනි iii. ගෝලකාල ප්‍රශ්නයෙනි
   ii. නලපාන ජාතකයෙනි iv. සේරිවාණිජ ජාතකයෙනි

4. කදාවළලු නාට්‍යයේ සිටුදියණියගේ වස්ත්‍රාභරණ අයත් වන්නේ,
   i. ආංගික අභිනයට iii. අභ්‍යන්තර සමාරෝපයට
   ii. බාහිර සමාරෝපයට iv. තාත්වික අභිනයට

5. මනසින් යමක් මවා ගැනීම හඳුන්වනු ලබන්නේ,
   i. සංවාද නමින් iii. නිරූපණය නමින්
   ii. උපකල්පනය නමින් iv. පරිකල්පනය නමින්

- 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා පහත ඇති ගොනුවෙන් අදාල පිළිතුර තෝරා ලියන්න.

**(රිද්මයානුකූල චලනය, දර්පනතල අභ්‍යාස, සාත්වික අභිනය, සතර අභිනය, සමාරෝපය)**

6. චරිත අනුකරණය කිරීමේදී ............................... භාවිතා වේ.
7. නළුවා බාහිරව හා අභ්‍යන්තරව චරිතවත් බවට පත්වීම ............................... වේ.
8. ඇස් අතර සම්බන්ධතාවය පවත්වාගෙන යාමට ............................... වැදගත් වේ.
9. මනස මූලික කරගන්නා භාවයන් මුහුණෙන් ප්‍රකට කරවීම ............................... වේ.
10. ශෛලීගත නාට්‍යයන් රඟපෑමේදී නළුවෙක් සතුව ............................... තිබිය යුතුය.

- ප්‍රශ්න අංක 11 සට 15 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

11. කදාවළලු නාට්‍ය අවසානයේ ලය පැලී මියයන චරිතය කුමක්ද?

    i. මිත්තණිය
    ii. කච්ඡපුට
    iii. දියණිය
    iv. සේරිවාණිජ

12. ලෝකයේ ස්වභාවයට බෙහෙවින්ම සමීප වෙන පරිදි සතර අභිනය භාවිතා කිරීම අයත් වන්නේ කුමන සම්ප්‍රදායටද?

    i. නාට්‍ය ධර්මී සම්ප්‍රදායටය
    ii. මිශ්‍ර සම්ප්‍රදායටය
    iii. ලෝක ධර්මී සම්ප්‍රදායටය
    iv. අර්ධ ශෛලීගත සම්ප්‍රදායටය

13. නාට්‍යක ගැටුම ඇතිවන්නේ,

    i. චරිත අතර අභ්‍යන්තර සමාරෝපය සිදුවීමෙන්
    ii. නාට්‍ය සංගීතය ඉස්මතු වීමෙනි
    iii. චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් මතුවීමෙනි
    iv. අනුෂාංගික අංග සංයෝජන වීමෙනි

14. බාහිර සමාරෝපයේදී රංග ශිල්පීන් සඳහා උපකාරී වන අභිනය කුමක්ද?

    i. ආංගික අභිනය
    ii. වාචික අභිනය
    iii. සාත්වික අභිනය
    iv. ආහාර්ය අභිනය

15. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර නාට්‍යයක් වන්නේද?

    i. කපුවා කපෝති
    ii. මඟුල් ප්‍රස්තාව
    iii. වෙද හටන
    iv. බහින කලාව

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.

16. ඕනෑම භූමිකාවක විවිධ චරිත ගණනාවක් තිබිය හැක. (   )
17. චරිත නිරූපණයේදී පෙර පුහුණුවීම අනිවාර්යයෙන්ම කළ යුතුය. (   )
18. නාට්‍යයේ පසුබිම පිළිබඳ ප්‍රකාශ කිරීමට වේදිකා පසුතලය යොදාගත නොහැක. (   )
19. ගායනය, සංගීතය හා නර්තනය වැනි අංග යොදා ගැනීමෙන් නාට්‍යයේ අර්ථය හා රසය ඉස්මතු නොවේ. (   )
20. රංගන ශිල්පීන්ගේ ඇස්වල සම්බන්ධතාවය මනාව හඳුනාගත හැකි වන්නේ හඬ අභ්‍යාස මඟිනි. (   )

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න. (II පත්‍රය සඳහා ලකුණු 30 කි.)

1.

   i. කදා වළලු නාට්‍යයෙන් හෙළිවන තේමාව කෙටියෙන් සඳහන් කරන්න.
   ii. කදා වළලු නාට්‍යයේ චරිත නම් කරන්න.
   iii. සේරිවාණිජ වෙළෙන්දාගේ හා කච්ඡපුට වෙළෙන්දාගේ චරිත ලක්ෂණ 02 බැගින් ලියන්න.
   iv. කදා වළලු නාට්‍යයේ අධ්‍යක්ෂකවරයාගේ නම ලියන්න.
   v. කදා වළලු නාට්‍යයේ ලෝක ධර්මී ලක්ෂණ හා නාට්‍ය ධර්මී ලක්ෂණ 02 බැගින් ලියන්න.

2.

   i. භූමිකා යනු කුමක්ද?
   ii. චරිතයක දක්නට ලැබෙන භූමිකා ප්‍රස්තාරයක් මගින් ඇඳ දක්වන්න.
   iii. රංග ශිල්පීන් චරිත නිරූපණයේදී සතර අභිනය භාවිතා කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

3.

   i. සමාරෝපනය යනු කුමක්ද?
   ii. සමාරෝපනයේ ප්‍රභේද නම් කර කෙටි හැඳින්වීමක් කරන්න.
   iii. හොඳ රූපණ ශිල්පියෙකු සතු ගුණාංග මොනවාද?

4.

   i. රංග අභ්‍යාස 02 නම් කරන්න.
   ii. ඉන් එක් අභ්‍යාසයක් සිදු කරන ආකාරය විස්තර කරන්න.
   iii. රූපන ශිල්පියෙකු රංග අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ලියන්න.

5.

   i. සතර අභිනය නම් කරන්න.
   ii. සතර අභිනය විස්තර කරන්න.
   iii. ඔබ නරඹා ඇති නාට්‍යයක සතර අභිනය යොදාගෙන ඇති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.